# ශ්‍රී ලංකා විදුලි සංදේශ නි◌ායමන කොමිෂන් සභාව

**සංඛ්‍යාලේඛන නිලධාරී තනතුර තනතුර සඳහා බඳවා ගැනීම (අභ්‍යන්තර)**

ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. රැකියා විස්තරය සහ වගකීම්

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අවශ්‍යතා අනුව, විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ දත්ත එකතු කිරීම, ඒවා සංවිධානය කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රචාරය කිරීම සිදු කිරීම.
2. සමීක්ෂණ සහ සංඛ්‍යානමය අධ්‍යයන සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. දත්ත සමුදා සහ තොරතුරු ගබඩා සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම.
4. සංඛ්‍යාන වාර්තා සහ ප්‍රකාශන සකස් කිරීම.
5. තීරණ ගැනීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු කාලෝචිතව ලබාදීම මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නි◌ායමන කොමිෂන් සභාවේ කළමනාකාරිත්වයට සහාය වීම.

## 2. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, සංඛ්‍යාන විද්‍යාව හෝ ගණිතය විෂයය සහිත උපාධියක් ලබා තිබීම .

සහ

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආශ්‍රිත, මෙහෙයුම් හෝ කළමනාකරණ සහකාර මට්ටමේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 03ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

## 3. බඳවා ගැනීමේ පටිපාටිය

ලිඛිත තරඟ විභාගය, ප්‍රායෝගික පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් ලබාගන්නා කුසලතා ප්‍රතිඵල පදනම් කරගෙන බඳවා ගැනීම් සිදු කෙරේ.

තරඟ විභාගය, ප්‍රායෝගික පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් ලබාගන්නා සමස්ත ලකුණු එකතුව මත පදනම්ව, සුදුසුකම් අනුව පමණක් පත්වීම් සිදු කරනු ලැබේ.

ලිඛිත විභාගයේ විෂයයන්:

අ) භාෂා ප්‍රවීණතාවය සහ හැකියා පරීක්ෂණය – පැය 2 – ලකුණු 100
ආ) තනතුරට අදාළ විෂය දැනුම – පැය 2 – ලකුණු 100

### 3.1 ප්‍රායෝගික පරීක්ෂණය:

මෙම පරීක්ෂණයේ අරමුණ වන්නේ අපේක්ෂකයාගේ විෂය දැනුම සහ කුසලතා ප්‍රායෝගික තත්ත්වයකදී යෙදවීමේ හැකියාව ඇගයීමයි. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ සිද්ධාන්තයක් හෝ

අත්දැකීමක් (case / experience) ලබාදී, නියමිත කාල සීමාව තුළ අපේක්ෂකයා ලබාදෙන ප්‍රතිචාරය ඇගයීමට ලක් කරනු ලැබේ.

බඳවා ගැනීමේ විභාගය සමත් වීමට, එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් අවම වශයෙන් 40%ක් සහ සමස්ත ලකුණු එකතුවෙන් අවම වශයෙන් 50%ක් ලබාගෙන තිබිය යුතුය.

**<u>4. වැටුප් පරිමාණය :</u>**

(1) TRC 4.1 - 118,239 - (10x2112)-(10x2816)-(10x3519) -(10x4223)-244,939

**<u>5. පොදු කොන්දේසි :</u>**

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්කිරීම් කාණ්ඩයේ VI වන පරිච්ඡේදයේ 77 වන වගන්තිය ප්‍රකාරව මෙම පත්වීම වසරක වැඩ බලන කාලයකට යටත් වේ.
2. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
3. අයදුම්පත් භාරගැනීම සඳහා නියම කර ඇති අවසන් දිනයට පෙර, ඉහත සඳහන් කර ඇති සියලුම අවශ්‍ය සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබේ නම් පමණක්, ඔහු/ඇය මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලත් අයෙකු ලෙස සැලකේ.
4. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**<u>6. අයදුම් කිරීමේ ක්‍රමය:</u>**

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික කළ පිටපත් සහ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පෙර පාලන හා ආයතනික කටයුතු අංශයට ඉදිරිපත් කළ යුතුය

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.06.01 වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක . 276, ඇල්විටිගල මාවත
කොළඹ 08